තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

**ආර් ඒ රහුමාන් එ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය**

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 148/ 2017 (මෙම අභියාචන විභාගය 2018.02.08 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ආර් ඒ රහුමාන් මහතා
**නොතීසි ලත් පාර්ශවය** - නම්කළ නිලධරයා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.07.05 |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | 2017.07.24 |
| **නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.08.02 |
| **නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | No response |
| **RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2017.08.23 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

**ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාව (මු. පි. අංක:7325) ට අදාළ තොරතුරු විමසීම් පිළිබඳව ය**

1. ඉහත කී කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයින් සහ නිවැසියන්ව කළමනාකරණ සංස්ථාවේ එවකට හා ඉදිරි වැඩකටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඔබගේ අධිකාරිය විසින් වර්ෂ 2017.02.17 වන දින පැවැත්වූ අතර එකී වැඩමුළුව සඳහා......
i) ඔබගේ අධිකරිය විසින් දැන්වීම්, ප්‍රචාරක, දේශක මඩුල්ල, නිලධාරීන්ගේ සහභාගීත්වය, තේ පැන් සංග්‍රහය යනාදිය වෙනුවෙන් වැය කළ සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණක් ද?
ii) එකී වැඩමුළුවට සහභාගී වූ කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයින් සහ නිවැසියන්ගේ මුළු ගණන කොපමණක් ද? එසේ සහභාගීවූවන්ගේ නාම ලේඛනයක් ඔබ සතුව ඇත්නම් පිටපතක් ලබා දෙන්න.
2. ඉන් අනතුරුව ඉහත කී කළමනාකරණ සංස්ථාවට වර්ෂ 2017.03.05 වන දින ඔබගේ අධිකාරිය විසින් කැඳවන ලද අති විශේෂ මහා සභා රැස්වීමේදී කළමනාකරණ සභාවට ගරු ලේකම් වශයෙන් ශාන්ති සිවගුරු මහත්මිය සහ එහි භාණ්ඩාගාරික වශයෙන් මනෝජා ශාන්මුගවෙල් මහත්මිය තේරී පත්වූ අතර,
i) කළමනාකරණ සභාවේ ඉතිරි සාමාජිකයන්ගේ නම් සහ ඔවුන් නියෝජනය කළ නිවාස ඒකකයේ විස්තර කුමක් ද?
ii) තේරී පත්වූ සාමාජිකයන් සියල්ලන්ම ඔවුන්ගේ අදාළ නිවාස ඒකකය සඳහා යම් මුදල් දායකත්වයක් 'කළමනාකරණ අරමුදලට' ලබාදී තිබේද? තිබේ නම් එක් එක් අය විසින් කොපමණ මුදල් ප්‍රමාණයකින් දායක වී තිබේද?

iii) එකී කළමනාකරණ සභාවේ සාමාජිකයින් සියල්ලන්ම ඔවුන්ගේ නිවාස ඒකකය වෙනුවෙන් වූ සේවා ගාස්තු හිඟ මුදල් සියල්ල ඒ වන විට අය කර තිබුනේ ද?

iv) එසේ තේරී පත්වූ සියල්ලන්ම (විශේෂයෙන් ඊ.ඒ. ඥානවතී, වී. ඒ.ජී ෆොන්ටගලන්, ඒ. ක්‍රිෂ්නමේනන්, පී. පිල්ලයි පාප්පු යන අය) අදාල කරගත යුතු පනත ප්‍රකාරව කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයින් ලෙස පිළිගත හැකි සුදුසුකම් ලත් අය ද? (අමුණා ඇති සාමාන්‍යාධිකාරිවරයාගේ 2017.01.24 දිනැති ලිපිය සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.)

v) යම් නිවාස ඒකකයක් වෙනුවෙන් ත්‍යාගරාජා යන මහත්මියක් නොව මහත්මයෙක් පුද්ගලිකව පෙනී සිටිමින් සහභාගී වුවා ද?

vi) ත්‍යාගරාජා මහන්මාව කළමනාකරණ සභාවේ සාමාජිකයෙක් වශයෙන් නම යොජනා කළ සහ එකී නම ස්ථිර කළ අයවලුන්ගේ නම් සහ ඔවුන් නියෝජනය කළ නිවාස ඒකකවල විස්තර කුමක් ද?

vii) අති විශේෂ මහා සභා රැස්වීමට සහභාගී නොවූ සාමාජිකයෙකුගේ නම කළමනාකරණ සභාවේ සාමාජිකයෙක් වශයෙන් යෝජනා කළ නොහැකි බව යම් විරෝධතාවක් මතුකරනු ලැබුවේද?

viii) 2017.03.05 වන දින තේරී පත්වූ කළමනාකරණ සභාවේ සාමාජිකයන් කිසිවෙක් දැනට ධුරයෙන් ඉල්ලා අස්වී සිටී ද? එසේනම් ඔවුන්ගේ නම් ලැයිස්තුව ලබා දෙන්න.

ix) ඉල්ලා අස්වූ සාමාජිකයින් වෙනුවට ඔවුන්ගේ තනතුරු දැරීම සඳහා වෙනත් සාමාජිකයින් පත් කර තිබේ ද? එසේනම් ඔවුන්ගේ තොරතුරු ලබා දෙන්න.

x) සාමාජිකයින් ඉල්ලා අස්වූ අවස්ථාවකදී එකී සාමාජිකයින් වෙනුවට නැවත ඇති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමකින් තොරව පුරප්පාඩු සඳහා සාමාජිකයින් පත් කිරීමට ඔබගේ අධිකාරියට හෝ සභාවට හැකියාවක් තිබේ ද? එවැනි පත් කිරීමක් සිදු කර තිබුනේ නම් ඒ බැව් සංස්තාවේ සාමාජිකයින්ව දනුවත් කර සිටියේ ද? නව පත් කිරීම් ලත් සභාපති, ලේකම්, උප ලේකම් භාණ්ඩාගාරික උප භාණ්ඩාගාරික නිලය දරණ සාමාජිකයින් කව්රුන් ද?

xi) අති විශේෂ මහා සභා රැස්වීමට සහභාගිවූ සාමාජිකයින් නොවන පුද්ගලයන් විසින් අදාළ සාමාජිකයින්ගෙන් ලබා ගත් ලිඛිත පෙරකලාසි ඉදිරිපත් කර සිටියේද? එසේනම් පෙරකලාසි ගොනු කරන ලද පුද්ගලයන්ගේ විස්තර කුමක්ද?

xii) 2017.03.05 දින පැවති අති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවක් ඔබගේ අධිකාරිය සතුව තිබේ නම් එකී වාර්තාවක් ලබා ගත හැකි ද?

3. අති විශේෂ මහා සභා රැස්වීමක් පවත්වන අවස්ථාවකදී ඊට පෙර පත්වූ කළමනාකරණ සභාව ස්වයංක්‍රීයව අහොසිවීමේ තත්වයක් උත්ගත වන බව බද්ද(සහාධිපත්‍ය) නිවාස අයිතිකම් (සංශෝධිත වර්ෂ 1982 අංක; 45) පනතේ හෝ වෙනත් යම් පනතේ සඳහන් වී තිබේ ද?

4. ඊට පෙර පැවැති කළමනාකරණ සභාවෙන් හෝ එකි සාමාරිකයන් කිසිවෙක් විසින් ඔවුන්ගේ සේවා කාලය තුළ යම් මුදල් අවභාවිතයක්/ අපහරණයක් හා|හෝ මුදල් අක්‍රමිකතාවක් සිදු කොට තිබුනේ ද? හෝ එවැනි යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් දැනට පවතින කළමනාකරණ සභාව විසින් හෝ ඔබගේ අධිකාරිය වීසින් විමර්ශනයක් සිදු කරමින් සිටී ද?

5. ක්‍රියාකාරී කළමනාකරණ සභාවක් තිබෙන අවස්ථාවකදී කළමනාකාරණ සංස්ථාවකට අති විශේෂි මහා සභා රැස්වීමක් කැඳවීමට ඔබගේ අධිකාරියට යම් විශේෂ නෛතික බලයක් තිබේ ද?

6. වර්තමාන කළමනානකරණ සභාවෙන් එකී සභාවේ බලතල හෝ වගකීම් කිසිවක් සංස්ථාවේ සාමාජිකයන් නොවන පිටස්තර පුද්ගලයන් කිසිවෙකුට පවරාදීමක් සිදු කොට තිබේ ද? එසේනම් ඔවුන්ගේ විස්තර ලබා දෙන්න.

7. වර්තමාන කළමනාකරණ සභාවෙන් ගෘහ කසල එක්රැස් කිරීමේ පුද්ගලික අයතනයට හෝ එහි සේවකයන්ට මාසිකව කිසිදු මුදල් අල්ලසක් හා/හෝ 'සන්තෝසම්' ප්‍රදානයක් සිදුකිරීම සඳහා යෝජනා සම්මත කර තිබේ ද?

8. ගෘහ කසළ එක්රැස් කිරීමේ පුද්ගලික ආයතනයට හෝ එහෙි සේවකයන්ට කිසිදු මුදල් අල්ලසක් හා/හෝ 'සන්තෝසම්' ප්‍රදානයක් කලින් තිබු කළමනාකරණ සභාව විසින් සිදුකර තිබු බව ඔබගේ අධිකාරියට වාර්තා වී තිබේද? එසේ නැත්නම් එවැනි මාසික ගෙවීමක් සිදු කර ඇති බව ඔවුන්ගේ විගණන වාර්තාවේ සඳහන් කර තිබේ ද?

9. වර්තමාන කළමනාකරණ සභාවේ මූල්‍යාමය කටයුතු පවත්වාගෙන යාමට/සිදුකිරීමට සභාවේ හෝ සංස්ථාවේ සාමාජිකයින්ගෙන් පරිභාහිරව යම් පුද්ගලයන්ට අවස්ථාවක් ලබා දී නිබේ ද? එසේනම් එකී කටයුත්ත සඳහා ඇනි කළ යෝජනා සම්මතයේ සහතික පිටපතක් ලබා දෙන්න.

10.ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාවේ පරිපාලනය යටතේ පවතින “ඒ” සහ “බී” ගොඩනැගිල්ල ඉදිකිරීම් කළ කාලය සිට අද දක්වා පත්වූ කිසිදු කළමනාකරණ සභාව විසින් නිසියාකාරව නඩත්තු කටයුතු කිසිවක් නොකිරීම හේතුවෙන් අතිශයින් ගරාවැටීමේ තත්වයට පත්ව ඇත. මෙමගින් සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ

පවුලේ අය ඇතුළුව ගොඩනැගිල්ල පරිහරණය කරන අනෙකුත් අයට දැඩි ජීවිත අවදානම් තත්වයෙන් සිටීමට සිදුව ඇත. දසක දෙකක් මුළුල්ලේ වැසිකිළි කාණු පද්ධතිය, වැහි පීලි, පොදු අංගඋපාංග නිසියාකාරව නඩත්තු නොකිරීමෙන් වැසිකිළි වතුර මෙන්ම වැසි වතුර දැඩි ලෙස අවස්ථා ගණනාවකදී පොදු අංගඋපාංගවල ගලායාමෙන් පාරිශරික සහ සෞඛ්‍ය ගැටළුවලට නිවැසියන්ට මුහුණ පෑමට සිදුව ඇත.

i) මෙම කාරණාව සම්බන්ධයෙන් ඔබගේ අධිකාරිය අවස්ථා කිහිපකදීම නිවැසියන් විසින් ලිඛිතව දැනුවත් කර සිටිය ද, ඔබගේ අධිකාරිය වීසින් ගනු ලැබූ පියවර කුමක් ද යන වග පිළිබඳව කිසිදු සටහනක් ඔබ අධිකාරිය සතුව තිබේ ද?

11. ගොඩනැගිල්ලේ පිටුපස (මුතුවැල්ල ක්‍රීඩා භූමිය) දෙසට පිහිටා තිබෙන යම් නිවාස ඒකකයේ හදිසි ගින්නක් ඇතිවූ විටකදී ගිනි නිවීමේ යන්ත්‍රයක්වත් ඇතුළු වීමට නොහැකි වන පරිදි “බී ” ගොඩනැගිල්ලේ බිම් මහලේ නිවාස ඒකක අයිතිකරුවන් කිහිප දෙනෙකු විසින් අනවසර ඉදිකිරීම් සිදු කර ඇති අතර හදිසි අවස්ථාවකදී ගින්නක් මැඩපැවැත්වීමට සුදුසු කට්ටල කිසිවක් කළමනාකරණ සංස්ථාව සතුව නොමැත.

ඉහත සඳහන් කාරණාව හා වෙනත් වැදගත් යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවසන් වරට පැවැත්වූ ඇති විශේෂ මහ සභා රැස්වීමේදී සාමාජිකයින් පිරිසක් විසින් ලිඛිතව ඉදිරිපත් කිරීමට උත්සහ කළ අවස්ථාව ඔබගේ අධිකාරියේ නිලධාරී මඩුල්ල විසින් සභාගත කිරීම ප්‍රතික්ෂේප කළ බව ඔබගේ අධිකාරිය වෙත 2017.03.09 දිනැති මාගේ ලිපියක් මගින් (ඇමුණුම් 2) දැනුවත් කර සිටියද, මේ වනතෙක් එකී ලිපිය හෝ එහි අඩංගු කාරණාවල් පිළිබඳව ය ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේද? එසේනම් ඒ පිළිබඳවූ විස්තර ලබා දෙන්න. ක්‍රියාමාර්ගයක් ගනු නොලැබුවේනම් හේතුකාරණා කුමක්ද යන වග දන්වන්න.

12. ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාවේ හෝ දැනට පරිපාලන කටයුතුවල නියැලන කළමනාකරණ සභාවේ යටතේ යම් ස්ථිර කම්කරුවෙකු හෝ වෙනත් සේවකයන් සිටීද? එසේනම් ඔවුන්ට පවරා තිබෙන වැඩ කොටස, සේවයට බඳවා ගත දිනය, මාසික වැටුප යනාදි විස්තර ලබාදෙන්න.

13. වර්තමාන කළමනාකරණ සභාව වෙනුවෙන් පෙනී සිටිමින් මට එරෙහිව වසමේ පොලිස් ස්ථානයට පැමිණිලි ඉදිරිපත් කිරීමට සාමාජිකයින් නොවන පුද්ගලයන් කිසිවෙකුට අවසරයක් ලබා දී තිබේද? එසේ නොවන්නේ නම් අසත්‍ය චෝදනා පදනම් කරමින් පැමිණිලි ඉදිරිපත් කළ/කරන එකී අයට හෝ සභාවේ සාමාජිකයින්ට එරෙහිව මා විසින් ගනු ලැබීමට යෝජිත නීතිමය පියවරවල් සම්බන්ධයෙන් ඔවුන් විසින් දැරිය යුතු වියදම් කළමනාකරණ සංස්ථාවේ අරමුදලින් දැරීමට හැකියාවක් තිබේ ද?

14. එසේම කළමනාකරණ සංස්ථාවේ වගකීම් සිතා මතාම පැහැර හරින සභාවේ සාමාරිකයින්ට එරෙහිව මා විසින් ගනු ලැබිමට යෝජිත නීතිමය පියවරවල් සම්බන්ධයෙන් ඔවුන් විසින් දැරිය යුතු වියදම් කළමනාකරණ සංස්ථාවේ අරමුදලින් දැරීමට හැකියාවක් තිබේ ද?

15. පෙර පැවති කළමනාකරණ සභාවෙන් ගෙවිය යුතු සහ ලබාගත යුතු යම් මුදලක් ඉන් අනතුරුව පත්වන සභාවෙන් නොපමාව ගෙවීමටත්, ලබාගැනීමටත් කළමනාකරණ සංස්ථාවෙන් ඔබගේ අධිකාරියේ පෙර අනුමැතියක් ලබාගැනීම අත්‍යවශ්‍ය බවට ඔබගේ අධිකාරියෙන් රෙගුලාසියක් පනවා තිබේ ද?

තොරතුරු නිලධාරියා 2017.07.24 දිනැතිව අයිතම 15ට පිළිතුරු සපයා තිබුණද අයිතම අංක 2 (i), (ii), (iv), (v), (vi), (vii), (ix), 3, 4, 5, 8 සහ14ට අසම්පූර්ණ, නොමඟ යවන සුළු සහ සාවද්‍ය තොරතුරු සපයා ඇත යන පදනම මත 2017.08.02 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා නියමිත කාලය ඇතුළත පිළිතුරු සැපයීමට අපොහොසත් වූ හෙයින් 2017.08.23 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

කොමිෂන් සභාවේ නොතීසි වලට පොදු අධිකාරිය ප්‍රතිචාර දක්වා නොතිබිණි.

**නියෝගය:**

අභියාචනය ලේඛණගත කර්යයපටිපාටියට අනුව සලකා බැලීමට නියමිතව තිබුණද පොදු අධිකාරිය ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් පෞද්ගලික විභාග කිරීමක් සඳහා 2017.04.26 දින පෙ.ව. 11.00 ට කැඳවනු ලැබේ.

*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/ 148/ 2017 (මෙම අභියාචන විභාගය 2018.04.26 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ය් නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ආර් ඒ රහුමාන් මහතා
**නොතීසි ලත් පාර්ශවය** - නම්කළ නිලධරයා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

**පෙනී සිටීම** -
අභියාචක: ආර් ඒ රහුමාන් මහතා
පොදු අධිකාරිය: ආර් කේ ජයවීර සමානායාධිකාරී
ජී ටී එස් පෙරේරා
එන් එල් ඉලේපෙරුම සහකාර සමානායාධිකාරී
ජේ ඩී එන් චන්ද්‍රපාල නියෝජ්‍ය සමානායාධිකාරී

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

විභාග කිරීම ආරම්භයේදී පොදු අධිකාරිය පවසා සිටියේ තම ආයතනය ශ්‍රී ලංකාවේ සියලු සහධිපත්‍යයන් අධීක්ෂණය සඳහා බලතල ලත් ආයතනයක් වන බවත්ය.
අභියාචකගෙන් තොරතුරු ඉල්ලීම කවර කරුණක් පදනම් කරගෙන සිදු කරේදැයි විමසා සිටයදී අභියාචක පවසා සිටියේ ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාව රැස්වීමක් කැඳවා එම සංස්ථාවෙහි කළමනාකරණ යට සාමාජිකයින් නොවූ පිරිසක් තොර පත් කර ගත් බැවින් ඊට අදාලවූ කරුණු ඉල්ලා සිටි බවයි. තවද ලබා දී ඇති සමහර තොරතුරු සාවද්‍ය බවද පවසා සිටින ලදී.
පොදු අධිකාරිය මෙම අවස්ථාවේදී පවසා සිටියේ කළමනාකරණ සංස්ථාව වෙනම පිහිටුවා ඇති වෙනම නඩත්තුවක් පාලනයක් ඇති නෛතික ආයතනයක් බවත්ය.
පොදු අධිකාරිය පවසා සිටියේ අභියාචක ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාවේ ලේකම් ලෙසද කටයුතු කළ බවයි. තවද මෙම ආයතනය අවශ්‍ය පරිදි මහසභා රැස්වීම්ද විශේෂ සභා රැස්වීම්ද පවත්වන බවයි. අභියාචක නිවෙස් හිමියෙක් නොවී මෙම තනතුර දැරීම සහ අනෙකුත් කරුණු පදනම් කරගෙන අභියාචකට විරුද්ධව අනෙක් නිවෙස් හිමියන් පැමිණිලි සිදු කිරීම හේතුවෙන්, නිවාස හිමිකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පමණක් සහභාගී විය හැකි විශේෂ මහා සභා රැස්වීමක් පවත්වා නව නිලධාරීන් පත් කරන ලදී. පොදු අධිකාරිය තවද පවසා සිටියේ අභියාචක තමා ලේකම් ව සිටි කාලය තුළ පවත්වාගෙන ගිය ලේඛන නව නිලධාරීන් හට ලබා නොදීම හේතුවෙන් නව කළමනාකරණයට තම කාර්ය භාරයද නිසියාකාරව සිදු කළ නොහැකි බවයි.
පොදු අධිකාරිය කෙසේ වෙතත් මෙම තොරතුරු ඉල්ලීමෙහි ඇති බොහෝ ප්‍රශ්න වලට පිළිතුරු, 1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත (සංශෝධිත) යටතේ ස්ථාපිත ශාන්ත ජේම්ස් කළමනාකරණ සංස්ථාවෙන් ලබා ගත යුතු බව පවසා සිටින ලදී.

**නියෝගය:**

2017.02.03 දිනැති 2004/66 අංක දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගහි නියෝග අංක 4 (vi) ට එනම්
*'ඉල්ලා සිටින තොරතුරු වෙනත් ආයතනයක් සතුව ඇති බව තොරතුරු නිලධාරියා දන්නේ නම් අයදුම්පත එකී තොරතුරු තබාගෙන ඇති පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා වෙත යවා ඒ බව අයදුම්කරුට ලිඛිතව දින 07ක් තුළ දන්වා යැවිය යුතුය,'*
යන්නට පොදු අධිකාරියෙහි අවධානය යොමු කර සිටිමු. ඒ අනුව මෙම තොරතුරු ඉල්ලීම සති දෙකක් ඇතුලත අවශ්‍ය කටයුතු සඳහා එම පොදු අධිකාරිය වෙත යොමු කරන ලෙසට නියෝග කර සිටිමු.
මීළඟ විභාග කිරීමේ දිනය: 25.05.2018

*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/ 148/ 2017 (මෙම අභියාචන විභාගය 2018.05.25 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ආර් ඒ රහුමාන් මහතා
**නොතීසි ලත් පාර්ශවය** - නම්කළ නිලධරයා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

**පෙනී සිටීම** -
අභියාචක: ආර් ඒ රහුමාන් මහතා
පොදු අධිකාරිය: ජී ටී එස් පෙරේරා

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය කොමිෂන් සභාවේ නියෝගය ප්‍රකාරව 2018.05.03 දිනැතිව කළමනාකරණ සංස්ථාව වෙත තොරතුරු ඉල්ලීමට අදාළ කරුණු විමසා සිටි අතර 2018.05.21 දිනැතිව අභියාචකට පිටපතක් සහිතව, කළමනාකරණ සංස්ථාවේ සභාපති පිළිතුරු සැපයූ බව පොදු අධිකාරිය පවසා සිටින ලදී. අභියාචක පොදු අධිකාරියෙහි 2018.05.03 දිනැති ලිඛිත දේශනයෙහි තිබූ වැරදි කරුණු පෙන්වා දුන් අතර එම වැරදි නිවැරදි කිරීමට පොදු අධිකාරිය එකඟ විය.

**නියෝගය:**

2018.05.21 දිනැති කළමනාකරණ සංස්ථාව විසින් ලබා දෙන ලද පිළිතුරෙහි පිටපතක් කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත ලැබීමට සලස්වන ලෙසත්, පොදු අධිකාරිය වෙත තම ලිඛිත දේශනයන්හි ඇති වැරදි කරුණු නිවැරදි කරන ලෙසටත් අභියාචක වෙත කළමනාකරණ සංස්ථාවෙහි

පිළිතුරු වලින් සෑහීමකට පත්වන්නේ දැයි මීළඟ විභාග කිරීමේ දිනට කොමිෂන් සභාව වෙත දන්වන ලෙසටත් නියෝග කර සිටිමු.
අභියාචනය මෙලෙස කල් තැබේ.

*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/ 148/ 2017 (මෙම අභියාචන විභාගය 2018.07.31 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති** - මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - ආර් ඒ රහුමාන් මහතා
**නොතීසි ලත් පාර්ශවය** - නම්කළ නිලධරයා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

**පෙනී සිටීම** -
අභියාචක: ආර් ඒ රහුමාන් මහතා
පොදු අධිකාරිය: ආර් කේ ජයවීර සමාන්‍යාධිකාරී
ජී ටී එස් පෙරේරා
එන් එල් ඉලේපෙරුම සහකාර සමාන්‍යාධිකාරී
ජේ ඩී එන් චන්ද්‍රපාල නියෝජ්‍ය සමාන්‍යාධිකාරී
සමන්ත අම්පාගල

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

ලබා දී ඇති තොරතුරු වලින් සෑහීමකට පත්වී සිටින්නේදැයි විමසා සිටියදී අභියාචක පවසා සිටියේ අයිතම අංක 2 (i) – (iv) සහ 2(xi) වලට හැර අනෙකුත් තොරතුරු වලින් සෑහීමකට පත්වී ඇති බවයි. පොදු අධිකාරිය පවසා සිටියේ කළමනාකරණ සංස්ථාව ලබා දී ඇති සියලු සටහන් ලබාදී ඇති බවත් අනෙකුත් තොරතුරු තම සන්තකයේ භාරයේ හෝ පාලනයේ නොමැති බවත්ය.
අනෙකුත් අයිතමයන් සම්බන්ධයෙන් පොදු අධිකාරිය පවසා සිටියේ එම වාර්තා/ ලේඛන තම සන්තකයේ නොමැති බවත් එම කාල වකවානුවට අයත් සටහන් / අයකිරීම් සිදු කිරීම භාරව සිටියේ අභියාචක සහ ප්‍රසන්න දේවි මොහාන් කුමාර් යන අය බවත් ඔවුන් විසින් කිසිදු වාර්තා කිරීමක් සිදු කර නොමැති බැවින් මෙම තොරතුරු ලබා දිය නොහැකි බවයි. අභියාචක මෙය තදින්ම ප්‍රතික්ෂේප කර සිටින ලදී.

**නියෝගය:**

කරුණු මෙසේ හෙයින් අභියාචනය අවසන් කරනු ලැබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදී ය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ 27(3) වගන්තියේ කොමිෂන් සභා රීතීන්ට (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය) අනුව මෙම නියෝගය අභියාචනයේ පාර්ශවකරුවන් හට ලබාදීමට කටයුතු කරන මෙන් නියෝග කර සිටිමු.

*****